රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2002

මගේ අංකය:-ආ/III/5/13
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2002.02. 25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ වාහන සඳහා අදාල ආයතනයේ නම යෙදීම

රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීම සම්බන්ධව නිකුත් කර ඇති 1992.08.19 දිනැති 26/92 හා 1994.08.03 දිනැති 26/92(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

රජයේ වාහනවල නිල ලාංඡන යෙදීම සම්බන්ධයෙන් යථොක්ත චක්‍රලේඛ වලින් උපදෙස් ලබාදී ඇතත් එම උපදෙස් නිසි ලෙස අනුගමනය කර නොමැති අවස්ථා ඇති බැව් නිරීක්ෂණය වී ඇත.

එහෙයින් දැනටමත් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීමට අමතරව අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නමද සටහන් කිරීමට ක්‍රියා කරන මෙන් ඔබ යටතේ ඇති සියලුම ආයතන ප්‍රධානීන්ට උපදෙස් දෙන්න.

එස්.රනුග්ගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ලක්/4/p.m/L-vaha